පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය
10

# අවසාන වාර පරීක්ෂණය - 2022

## විෂයය : භූගෝල විද්‍යාව

පාසලේ නම : ..................................................................................... කාලය පැය තුනයි වි. 10කි.
ඇතුළත්වීමේ අංකය : .............................

- භූගෝල විද්‍යාව 1 පත්‍රය ප්‍රශ්න 40 කින් සමන්විත වේ..
- එක් එක් ප්‍රශ්නය සදහා දී ඇති උපදෙස්වලට අනුකූලව සියලුම ප්‍රශ්නවලට මෙම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයන්න.

- අංක 1 සිට 10 තෙක් දී ඇති ප්‍රශ්නවල එක් එක් හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා තිත් ඉර මත ලියන්න..

1. සම්පූර්ණයෙන්ම ගොඩබිමෙන් වටවූ මුහුදක් ලෙස .................................................. හැඳින්විය හැකිය.

   (බෝල්ටික් මුහුද / අරාබි මුහුද/ කැස්පියන් මුහුද )

2. බටහිර යුරෝපා රටවල් අතරින් ..................................................ව්‍යාපාරික කිරිපට්ටි පාලනයට ප්‍රසිද්ධියක් උසුලයි.

   ( ඉතාලිය /ඩෙන්මාර්කය / ප්‍රංශය )

3. බලශක්තිය නිපදවීම සදහා ශ්‍රී ලංකාවේ බහුලව ම භාවිතා කරන ශක්ති මූලය ........................................වේ

   ( ජෛව ස්කන්ධ / පෙට්‍රෝලියම් / ජලය )

4. 1:50000 භූ ලක්ෂණ සිතියමක දුර ගණනය කිරීමේ දී කිලෝ මීටර් 1 ක දුරක් පෙන්නුම් කිරීමට .......................................ක් යොදා ගනී. ( 3 c m /2 c m / 5 c m )

5. ශ්‍රී ලංකාවේ රබර් පර්යේෂණායතනය .................................................. ප්‍රදේශයේ පිහිටා ඇත.

   ( අගලවත්ත /රත්නපුර/ කළුතර)

6. නැව් නිෂ්පාදනයේ ප්‍රමුඛයන් අතර සිටිනා ආසියාතික රටකි .............................................

   ( චීනය / තායිලන්තය / බංග්ලාදේශය )

7. 1:50000 භූ ලක්ෂණ සිතියමක සිතියම් නාමය දක්වා ඇත්තේ .............................................

   ( සිතියමේ පහළ කොටසේය./ ඉහළ දකුණු කෙළවරේය./ වට තීරුවේ ඉහළ කොටසේ මධ්‍යයේය.

8. ඕසෝන් ස්ථරය .................................ගෝලයේ පිහිටා ඇත.

   ( පරිවර්තීය /අපරිවර්තීය / මෙසෝ )

9. පෘථිවි ශිලා ගෝලය විශාල තැටි .........................................කින් සමන්විත වේ.

   ( හය / හත / අට )

10. ලෝකයේ විශාලතම විල ලෙස ...............................විල සැළකේ .

( සුපීරියර් / ටිටිකාකා / බයිකල් )

- ප්‍රශ්න අංක 11 සිට 15 තෙක් දී ඇති ප්‍රකාශ හරි නම් √ හරි ලකුණ ද වැරදි නම් x ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන තුළ යොදන්න.

11. වී වගා කරන රටවල් බොහෝමයක් පිහිටා ඇත්තේ ආසියා මහද්වීපය තුළ ය. ( ........ )
12. ලෝකයේ නිවර්තන දේශගුණයක් පවතින ප්‍රදේශවලට ලැබෙන්නේ අඩු වර්ෂාපතනයකි. (........ )
13. භෞතික ලක්ෂණ හා මානව ක්‍රියාකාරකම් අතර සම්බන්ධතාවය හඳුනා ගැනීමට භූ ලක්ෂණ සිතියම් වැදගත් වේ. (........ )
14. ජපානයේ ඔසාකා හා කියතෝ යන ප්‍රදේශ යකඩ හා වානේ නිෂ්පාදන මධ්‍යස්ථාන පිහිටි නගර ලෙස වැදගත් වේ. ( ........ )
15. සුළු අපනයන භෝගයක් වන කජු තෙත් කලාපීය ප්‍රදේශ වල හොඳින් වැවෙන භෝගයකි. ( ........ )

•අංක 16 සිට 20 තෙක් දී ඇති ප්‍රශ්න වල අ " සහ ආ " යනුවෙන් තීර දෙකක් දැක්වේ. ඒවා සම්බන්ධතාව අනුව ගැළපූ විට ලැබෙන පිළිතුරට යටින් ඉරක් අඳින්න.

16. පෘථිවි වායුගෝලයේ ප්‍රධාන ස්ථර කීපයක් අ " තීරුවේ දක්වා ඇත.වායුගෝලීය ස්ථරවල ව්‍යාප්තියෙහි ඉහළ සීමාවේ උස ආ "තීරුවේ දැක්වේ . අ " තීරුවේ අනුපිළිවෙළට ආ "තීරුව ගැළපූ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.

| " අ " තීරුව | " ආ " තීරුව |
|---|---|
| 1 පරිවර්තීය ගෝලය | A 50 km |
| 2 අපරිවර්තීය ගෝලය | B 20 km |
| 3 මෙසෝ ගෝලය | C 120 km |
| 4 තාප ගෝලය | D 80 km |

(i) A C B D (iii) C D A B
(ii) B A D C (iv) D B C A

17. ශ්‍රී ලංකාවේ නිෂ්පාදන කර්මාන්ත සඳහා යොදා ගන්නා අමුද්‍රව්‍ය කීපයක් අ " තීරුවේ දැක්වේ. ඒවා ව්‍යාප්තව ඇති ප්‍රදේශ ආ " තීරුවේ දැක්වේ. මෙම තීර දෙක ගළපා නිවැරදි පිළිතුර තෝරන්න.

| " අ " තීරුව | " ආ " තීරුව |
|---|---|
| 1 මිනිරන් | A දෙදියවල |
| 2 මයිකා | B බොරලැස්ගමුව |
| 3 බෝල මැටි | C බදුල්ල |
| 4 කෙඕලින් | D බෝගල |

(i) A C B D (iii) C D A B
(ii) B A D C (iv) D C A B

18. ලෝකයේ පිහිටි කඳුවැටි කීපයක් අ " තීරුවේ දක්වා ඇත. ඒවා පිහිටි මහද්වීප ආ තීරුවේ දැක්වේ. මෙම තීර දෙක ගැළපූ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න."

| අ " තීරුව | ආ " තීරුව |
|---|---|
| 1 රොකී කඳු | A යුරෝපා මහද්වීපයේ |
| 2 ඇට්ලස් කඳු | B උතුරු ඇමරිකා මහද්වීපයේ. |
| 3 මහා බාධක කඳු | C අප්‍රිකානු මහද්වීපයේ. |
| 4 ඇල්ප්ස් කඳු | D ඕස්ට්‍රේලියා මහද්වීපයේ. |

(i) C A D B (iii) A C B D
(ii) B A D C (iv) B C D A

19. ශ්‍රී ලංකාවේ තේ ,පොල් , රබර් , හා සුළු අපනයන බෝග අ " තීරුවේ දක්වා ඇත. ඒ පිළිබඳ පිහිටුවා ඇති පර්යේෂණායතනය ආ තීරුවේ දැක්වේ. මෙම තීර දෙක ගැළපූ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.

| " අ " තීරුව | " ආ " තීරුව |
|---|---|
| 1 තේ | A ලුනුවිල |
| 2 පොල් | B මාතලේ |
| 3 රබර් | C තලවකැළේ |
| 4 සුළු අපනයන බෝග | D අගලවත්ත. |

(i) C A D B (iii) B A D C
(ii) A C B D (iv) C A D B

20. ලෝකයේ දූපත් කීපයක් " අ " තීරුවේ දක්වා ඇත. ඒවා පිහිටි මහද්වීපික තටක "ආ " තීරුවේ දැක්වේ. මෙම තීර දෙක ගැළපූ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.

| " අ " තීරුව | " ආ " තීරුව |
|---|---|
| 1 තස්මේනියා දූපත | A ආසියා මහද්වීපික තටකය |
| 2 මැඩගස්කර් දූපත | B ඕස්ට්‍රේලියා මහද්වීපික තටකය. |
| 3 බෝර්නියෝ දූපත් | C යුරෝපා මහද්වීපික තටකය. |
| 4 බ්‍රිතාන්‍ය දූපත් | D අප්‍රිකා මහද්වීපික තටකය. |


I. C A D B 5 B A D C
II. A C B D 6 B D A C

- ප්‍රශ්න අංක 21 - 25 දක්වා ප්‍රශ්න වල හිස්තැන්වලට සුදුසු වචන යොදා සම්පූර්ණ කරන්න.

21. පෘථිවි ශිලා ගෝලය එකිනෙකට සාපේක්ෂව ඉතා සෙමින් චලනය වෙමින් පවතින .................රාශියකින් නිර්මාණය වී ඇත.
22. රබර් වගාව සඳහා ඉතාමත් සුදුසු පස් වර්ගය ලෙස ..........................පස හැඳින්විය හැකිය.
23. භාවිතයෙන් ඉවත් කළ හා පරණ යකඩ ...............................තුළින් නැවත භාවිතයට ගත හැකිය
.
24. ශ්‍රී ලංකාවේ නිෂ්පාදන කර්මාන්ත වල සංයුතිය දෙස බැලීමේදී වැඩිම අගයක් ..................ක්ෂේත්‍රයට හිමිව ඇත.


25. ශ්‍රී ලංකාවෙන් තේ මිලදී ගන්නා ප්‍රධාන කලාපය වන්නේ ......................................යි.

* දී ඇති ලෝක සිතියම ඇසුරෙන් ප්‍රශ්න අංක 26 සහ 27 සඳහා පිළිතුරු සපයන්න.




26. තේ වගා කරන ප්‍රධාන රටක් වූ කෙන්යාව දැක්වෙන අක්ෂරය වන්නේ …………….ය
27. ලෝකයේ තිරිඟු වගාවට ප්‍රචලිත රටක් B අක්ෂරයෙන් දැක්වේ. එම රට කුමක්ද? …………

* පහත දැක්වෙන්නේ 2013 වර්ෂයේ නිකුත් කළ මහබැංකු වාර්තාවකට අනුව 2008 - 2012 කාලයේ ශ්‍රී ලංකාවේ පොල් නිෂ්පාදනය පිළිබඳ තොරතුරු ඇතුළත් ප්‍රස්තාරයකි. ඒ ඇසුරින් 28 29 හා 30 යන ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.




28. ප්‍රස්තාරයට අනුව පොල් නිෂ්පාදනය වැඩිම වර්ෂය කුමක්ද?...........................................
29. අඩුම පොල් නිෂ්පාදනයක් දක්නට ඇත්තේ කුමන වර්ෂයේද?.........................................
30. 2011 වර්ෂයට වඩා 2012 වර්ෂයේ කොපමණ පොල් ප්‍රමාණයක් නිෂ්පාදනය කර තිබේද? .............

* අංක 31 - 40 තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට දී ඇති පිළිතුරු හතර අතුරෙන් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න

31. 1:50000 හූ ලක්ෂණ සිතියමකින් නිරූපණය වන සැබෑ භූමියේ වර්ග ප්‍රමාණය වන්නේ
    i. වර්ග කිලෝමීටර් 2000 කි.
    ii. වර්ග කිලෝමීටර් 1000 කි.
    iii. වර්ග කිලෝමීටර් 2500 කි.
    iv. වර්ග කිලෝමීටර් 3000 කි.
32. ශ්‍රී ලංකාවේ කිරිගව සම්පත් හුවමාරු මධ්‍යස්ථානයක් ලෙස වැදගත් වන්නේ ....
    (i) මීවන පලාන (iii) කනන්විල
    (ii) වල්පිට (iv) අම්පාර
33. වී වගා කරන ප්‍රදේශ අතරින් යුරෝපා මහද්වීපය තුළ වැදගත් ගංගා නිම්නයක් වන්නේ

    (i) නයිල් ඩෙල්ටාව
    (ii) සැක්‍රමැන්ටෝ නිම්නය
    (iii) පෝ ගංගා නිම්නය.
    (iv) මරේ ඩාලින් ගංගා නිම්නය

34. නිෂ්පාදන කර්මාන්ත ආශ්‍රිතව පැන නැගී ඇති පාරිසරික ගැටළුවක් නොවන්නේ මින් කුමක්ද?

(i) ඇතැම් ශාක හා සත්ත්ව ප්‍රජාවන් වඳවීම.
(ii) සාගර පත්ල දූෂණය.
(iii) රොබෝ තාක්ෂණය භාවිතය
(iv) බැර ලෝහ අංශු නිසා ජාන විකෘතිවීම

35. පහත දැක්වෙන ප්‍රකාශ අතරින් ජෛව ගෝලය පිළිබඳ සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.
(i) ජෛව ගෝලයේ ශාක හා සත්ත්ව ප්‍රජාවන් අතර අන්තර් ක්‍රියාකාරීත්වයක් දක්නට ඇත.
(ii) ජෛව ගෝලය යනු නිරතුරු ක්‍රියාකාරී සමස්ත ජීවී පරිසරයයි.
(iii) ජෛවගෝලය මුළුමනින් ම සමන්විත වන්නේ ශිලාගෝලයේ හා ජල ගෝලයේ කොටස් වලිනි.
(iv) ප්‍රභා සංස්ලේෂණ ක්‍රියාවලිය සිදුවන්නේ ජෛව ගෝලය තුළදීය.

- අංක 36 හා 37ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීමට පහත තොරතුරු උපයෝගී කර ගන්න.
  A. ඕසෝන් ස්ථරය හායනය වීම.
  B. පාංශු බාදනය
  C. අහිතකර හිරු කිරණ පෘථිවි පෘෂ්ඨයට පතිතවීම.
  D. කෘෂි අස්වැන්න.
  E. වායු ගෝලීය උෂ්ණත්වය.

36. එක සාධකයක වැඩිවීම වෙනත් සාධකයක අඩුවීම කෙරෙහි බලපෑමක් ඇතිකරන බවට දැක්වෙන ප්‍රකාශ අඩංගු අක්ෂර දෙක ඇතුළත් පිළිතුර වන්නේ

(i) A හා C ය
(ii) C හා E ය
(iii) A හා E ය
(iv) B හා D ය

37. එක සාධකයක වැඩිවීම තවත් සාධකයක ද වැඩිවීම කෙරෙහි බලපෑමක් ඇතිකරන බව දැක්වෙන ප්‍රකාශ අඩංගු අක්ෂර දෙක ඇතුළත් පිළිතුර වන්නේ
(i) C හා E ය.
(ii) B හා C ය.
(iii) A හා C ය.
(iv) A හා E ය.

38. ලෝකයේ උස්බිම් ආශ්‍රිත සානු අතරින් මුහුදු මට්ටමේ සිට උසින්ම පිහිටි සානුව වන්නේ
(i) පාමීර් සානුව
(ii) අරාබි සානුව
(iii) ටිබෙට් සානුව
(iv) මොංගෝලියානු සානුව

39. ලෝකයේ නිෂ්පාදන කර්මාන්තයන්හි වෙළඳපොළ ආශ්‍රිතව දක්නට ලැබෙන ගැටළුවක් වන්නේ
(i) බලශක්ති සම්පත් ක්ෂය වෙමින් පැවතීම.
(ii) විවිධ භාණ්ඩ සඳහා ආදේශක වෙළෙඳපොළට ඉදිරිපත් කිරීම.
(iii) යුද අවි නිෂ්පාදනය නිසා ලෝක සාමයට බාධා ඇතිවීම.
(iv) ස්වභාවික අමුද්‍රව්‍ය වෙනුවට කෘතිම අමුද්‍රව්‍ය යොදා ගැනීමට සිදුවීම.

40. 1 : 50000 භූ ලක්ෂණ සිතියම්වල වර්ණ භාවිතයේදී කහපැහැයෙන් නිරූපණය කොට ඇත්තේ
(i) වී වගාව
(ii) ගෙවතු වගාව
(iii) වැව් බැම්ම.
(iv) පාෂාණ උද්ගත

# 11 පත්‍රය

මෙම ප්‍රශ්න පත්‍රය 1 හා 11 වශයෙන් කොටස් දෙකකින් සමන්විත ය.
1 කොටසේ ප්‍රශ්නය අනිවාර්ය වේ. එහි (අ ) (ආ ) (ඉ ) කොටස් තුනටම පිළිතුරු සැපයිය යුතුය
11 කොටසින් ප්‍රශ්න හතරකට පිළිතුරු සැපයිය යුතුය.
පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව **පහකි.**

1 - කොටස

(01) අ)

(i) භූ ලක්ෂණ සිතියමක දක්නට ලැබෙන ප්‍රධාන ලක්ෂණ දෙකක් සඳහන් කරන්න. ( ලකුණු 2 යි)


(ii) 1 : 50000 භූ ලක්ෂණ සිතියම් වල දිශාව දැක්වීමට විශේෂ සටහනක් යොදා ඇත. එහි G N හා M N යන අක්ෂරයන්ගෙන් නිරූපණය වන්නේ කුමක්ද? ( ලකුණු 2 යි)

(iii) සිතියමක පරිමාණය දක්වන ක්‍රම දෙක ලියා දක්වන්න. ( ලකුණු 2 යි)

(iv) 4 km දුරක් දැක්වීම සඳහා රේඛීය පරිමාණය ඇඳ පෙන්වන්න. ( ලකුණු 2 යි)

(v) 1 : 50000 භූ ලක්ෂණ සිතියම්වල , පළාත් මායිම , පාසල , පොලීසිය , පුළුල් ඒකීය දුම්රිය මාර් ගය යන දෑ දැක්වීම සඳහා යොදා ඇති සම්මත සංකේත ඇඳ දක්වන්න. ( ලකුණු ½ x 4}2 යි)

(ආ ) මෙහි දැක්වෙන ලෝක සිතියම හොඳින් අධ්‍යනය කර පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න




(i) තිරිගු වගාවට ප්‍රසිද්ධියක් උසුලන දකුණු ඇමරිකානු රාජ්‍යයක් වන ආර්ජෙන්ටිනාව දැක්වෙන අක්ෂරය......................

(ii) A අක්ෂරයෙන් දැක්වෙන්නේ නයිල් නදිය ආරම්භ වන විලයි. එය නම් නරන්න........................................

(iii) මෝටර් රථ නිෂ්පාදනයට ප්‍රමුඛ රටක් වූ දකුණු කොරියාව දැක්වෙන අක්ෂරය ................


(iv) මරේ ඩාලිං ගංගා නිම්නය දැක්වෙන අක්ෂරය ..................

(v) G H I යන අක්ෂර අතුරෙන් සුමාත්‍රා දූපත දැක්වෙන අක්ෂරය ...........................

(ලකුණු 05 යි)

( ඉ )

- මෙහි ඇති ශ්‍රී ලංකා සිතියම හොඳින් අධ්‍යනය කර පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න..




(i) ශ්‍රී ලංකාවේ අඩුම වී වගා බිම් ප්‍රමාණයක් සහිත නුවරඑළි දිස්ත්‍රික්කය දැක්වෙන අක්ෂරය................
(ii) සුළු අපනයන බෝග පර්යේෂණ ආයතනය පිහිටි නගරය අයත් අක්ෂරය..................................
(iii) කිවුල් දිය ධීවර කර්මාන්තය සඳහා ප්‍රසිද්ධියක් උසුලන මීගමු කළපුව......................................
(iv) සිතියමේ D E F අක්ෂර වලින් දැක්වෙන ගංගාවන් අතරින් වළවේ ගඟ දැක්වෙන අක්ෂරය............
(v) B අක්ෂරයෙන් දැක්වෙන බොක්ක නම් කරන්න................................................................

(ලකුණු 05 යි)

## 11 - කොටස

2)

i. වායු ගෝලීය සංයුතිය අනුව වැඩි වායු ප්‍රතිශතයක් ගන්නා වායු වර්ග දෙක නම් කරන්න. (ලකුණු 02 යි)
ii. වායු ගෝලයේ ඇති ස්ථර අතුරෙන් පරිවර්තීය ගෝලය මිනිසාට වඩා වැදගත් වීමට හේතු තුනක් සඳහන් කරන්න. (ලකුණු 03යි)
iii. a) පෘථිවියේ ජල ව්‍යාප්තිය දක්නට ලැබෙන ආකාර දෙකක් නම් කරන්න. (ලකුණු 02 යි)
b)වර්තමානයේ ජලයේ ගුණාත්මකබව අඩුවීම කෙරෙහි බලපාන මිනිස් ක්‍රියාකාරකම් දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 03 යි)

3)

(i) ලෝක මට්ටමින් පුළුල් දේශගුණ වර්ගීකරණයක් ඉදිරිපත් කළ පුද්ගලයන් දෙදෙනෙකු නම් කරන්න. (ලකුණු 02 යි)
(ii) අක්ෂාංශීය උෂ්ණත්ව ව්‍යාප්තිය පදනම් කරගෙන බෙදා දැක්විය හැකි දේශගුණික කලාප තුන නම් කරන්න (ලකුණු 03යි)
(iii) මධ්‍ය අක්ෂාංශීය ප්‍රදේශයන්හි දේශගුණයේ දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

4)

i. ) වරහන් තුළ ඇති රටවල් අතුරෙන්


(a) තිරිඟු වගාවට වැදගත් වන උතුරු ඇමරිකානු රටක් ද
(b) කපු වගාවට වැදගත් වන ආසියාතික රටක් ද නම් කරන්න.

( ඉන්දියාව / ආර්ජෙන්ටිනාව / තුර්කිය / කැනඩාව / තායිලන්තය ) (ලකුණු 02 යි)

(ii) රබර් වගාව ආශ්‍රිතව දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ තුනක් සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(111) ලෝකයේ වී වගාව ආශ්‍රිත ව දැකිය හැකි විශේෂ ලක්ෂණ තුනක් දක්වා ඉන් කරුණු දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05 යි)

5) ශ්‍රී ලංකාවේ වී වගා කරනු ලබන ප්‍රධාන කලාප ඇතුළත් සිතියම මෙහි දැක්වේ




(i) .එහි සඳහන් 1 හා 2 කලාප මොනවාදැයි පිළිවෙළින් ලියා දක්වන්න. (ලකුණු 02 යි)

(ii) අංක 1 කලාපයේ වී වගාවේ කැපී පෙනෙන ලක්ෂණ තුනක් ලියන්න (ලකුණු 03යි)

(iii) ශ්‍රී ලංකාවේ කරදිය ධීවර කර්මාන්තය දියුණු කරලීමට අවශ්‍ය හිතකර භෞතික සාධක බොහෝමයක් ශ්‍රී ලංකාව සතු වේ. එම ලක්ෂණ තුනක් දක්වා ඉන් දෙකක් විස්තර කරන්න. (ලකුණු 05 යි)

6)

(i) කර්මාන්තයක් ස්ථානගත වීම කෙරෙහි බලපාන සාධක දෙකක් නම් කරන්න. (ලකුණු 02 යි)
(ii) නැව් තැනීමේ කර්මාන්තය ආසියාව කරා ප්‍රචලිත වීමට බලපෑ කරුණු තුනක් ලියන්න. (ලකුණු 03 යි)
(iii) ලෝක නිෂ්පාදන කර්මාන්ත ආශ්‍රිත පැන නැගී ඇති ගැටළු අතර , බලශක්තිය ආශ්‍රිත පැන නැගී ඇති ගැටළු තුනක් දක්වා ඉන් දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05 යි)

7)

(i) ශ්‍රී ලංකාවේ ධමනි මිනිරන් ව්‍යාප්තව ඇති ප්‍රදේශ තුනක් නම් කරන්න. (ලකුණු 02 යි)
(i) ධමනි මිනිරන් යොදාගෙන සිදු කරන නිෂ්පාදනයන් තුනක් නම් කරන්න. (ලකුණු 03 යි)
(ii) මිනිරන් කර්මාන්තය ආශ්‍රිතව පවතින ගැටළු තුනක් දක්වා ඉන් දෙකක් විස්තර කරන්න.(ලකුණු 05 යි)

8)

(i) සංචාරක කර්මාන්තයේ දියුණුවට ඉවහල්වන ඓතිහාසික උරුමයන් දක්නට ලැබෙන නගර දෙකක් නම් කරන්න (ලකුණු 02 යි)

(ii) ඉහත දැක්වූ ඓතිහාසික ප්‍රදේශ වලට අමතරව ප්‍රධාන සංචාරක කලාප තුනක් නම් කරන්න (ලකුණු 03 යි).

(iii) ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය ආශ්‍රිත ප්‍රවනතා තුනක් දක්වා ඉන් දෙකක් විස්තර කරන්න (ලකුණු 05 යි).

# භූගෝල විද්‍යාව 10 - ශ්‍රේණිය

## පිළිතුරු පත්‍රය

**2022 iii වාර පරීක්ෂණය**

1. කැස්පියන්
2. ඩෙන්මාර් කය
3. ජෛව ස්කන්ධ
4. 2cm
5. අගලවත්ත
6. චීනය
7. වට තීරුවේ ඉහල කොටසේ මධ්‍ය යේ
8. අපරිවර් ති
9. හත
10. සුපිරියර්
11. √
12. ×
13. √
14. √
15. ×
16. B A D C
17. D C A B
18. B C D A
19. C A D B
20. B D A C
21. භූ තැටි
22. ලැටරයිට්
23. ප්‍රතිචක්‍රීයකරණය
24. ඇහලුම්
25. මැද පෙරදිග
26. C
27. ප්‍රංශය
28. 2012
29. 2010
30. මිලියන 132
31. 1000 $km^2$
32. මීවනපලාන
33. පෝ ගංගා නිම්නය
34. රොබෝ තාක්ෂණ භාවිතය
35. ජෛව ගෝලය මුළුමනින් ම සමන්විත වන්නේ ශිලා ගෝලය හා ජල ගෝලයේ කොටස් වලිනි.
36. B හා D
37. A හා C
38. ටිබෙට් සානුව
39. විවධ භාණ්ඩ සඳහා ආදේශක වෙළඳපොලට ඉදිරිපත් වීම.
40. ගෙවතු වගාව

1) අ). භූ දර් ශනය පරිමානුකූලව හකුලා දැක්වීම.
දිශාව පිහිටීම නිවැරදි ව දැක්වීම.
අවකාශීය තොරතුරු රාශියක් ඉදිරිපත් කිරීම.
තොරතුරු දැක්වීමට සංකේත වර් ණ භාවිතය.
පෘථිවිතලය සාමාන්‍යකරණය කිරීම.
අවකාශිය තොරතුරුවල නිවැරදි සම්බන්ධතාවය පෙන්වීම.
( මින් කරුණු 2ක් - ලකුණු 2 යි)

II. G.N ජාල යතුර ( GRID NORTH)

M.N චුම්භක අතුර ( MAGNETIC NORTH) ( ල-2යි)

III. රේඛීය නිර් මාණය

නියෝජ්‍ය නිර් මාණය ( ල- 2යි)

IV. 8cm දුරක් දැක්වෙන රේඛීය පරිමාණය නිවැරදිව ඇද ලකුණු කොට තිබේ නම් ලකුණු 2ක් දෙන්න.

V. පළාත් මායිම

පාසල

පොලිසිය

පුළුල් ඒකීය දුම්රිය මාර් ගය ( සංකේත 4 නිවැරදිව ඇද ඇත්නම් ලකුණු භාගය බැගින් ලබා දෙන්න. උ.ල 2යි)

ආ) I. B

II. වික්ටෝරියා

III. I

IV. F

V. H ( ලකුණු 5යි)

ඉ) I. A

II. C

III. G

IV. E

V .ආරු ගම්බේ ( ලකුණු 5යි)

II කොටස

2). නයිට්‍රජන් , ඔක්සිජන් ( ල- 2යි)

II. පතන සීග්‍රතාවය ක්‍රියාත්මක වීම නිසා දේශගුනික වෙනස්කම් ඇති වීම.

ජෛව ගෝලයේ පැවැත්ම සඳහා පරිවර් ති ගෝලයේ ක්‍රියාකාරිත්වය වැදගත් වීම.

වර් ෂණය, උෂ්ණත්වය, පීඩනය, සුළං, ආර් ද්‍රතාවය වැනි කාලගුණික සංසිද්ධි ඇති වීම. ( ල - 3 යි)

III. a) .සාගර ජලය / භූගත ජලය / භූ තල ජලය/ වායුගෝලීය ජලය / පාංශු ජලය

( මින් 2ක් - ලකුණු 2යි)

b). කෘෂි කාර් මික ගලා යාම.

නුසුදුසු ස්ථානවල කුණු විසි කිරීම.

නාගරික අපද්‍රව්‍ය හා වැසි ජලය

කාර් මික අපද්‍රව්‍ය ආදි ( මින් 2ක් විස්තර කරන්න. ලකුණු 3යි)

I. ඔස්ටින් විලර් / තෝන්ත්වේට් / කෙපන් ( මින් 2ක් - ල- 2යි)

Ii. නිවර් තන කලාපය

සෞම්‍ය කලාපය

ශීත කලාපය ( ල - 3යි)

III. සාමාන්‍ය උෂ්ණත්වය අඩුයි.

ඍතු භේදය නිසා උෂ්ණත්වය අඩු වැඩි වේ.

පැහැදිලි උණුසුම් ඍතුවක් සහ වර් ෂාපතනය සහිත ශිත ඍතුවක් දක්නට ලැබේ.

මධ්‍යධරණි දේශගුණය විශේෂ වේ.

(මින් කරුණු 2ක් විස්තර කළ යුතු ය. ල - 3යි)

4) I a. කැනඩාව

b. ඉන්දියාව (ල- 2යි)

ii විශාල වතු වශයෙන් ව්‍යාප්ත වී තිබීම.

ශ්‍රම සූක්ෂම වගාවක් වීම

කිරි කැපීම හා එකතු කිරීම සඳහා මූලික වශයෙන් මිනිස් ශ්‍රම භාවිතා වුව ද මෑත කාලීන ව නව තක්ෂණික උපක්‍රම භාවිතා කිරීම / අමු ද්‍රව්‍යක් ලෙස රබර් වලට ඇති ඉල්ලුම වැඩි වීම / රබර් වගා කරන රටවල් අමුද්‍රව්‍ය අපනයනය කිරීමත් සමඟ දේශිය වශයෙන් නිමි භාණ්ඩ නිෂ්පාදනයට යොමු වීම./ රබර් වගා කරන සංවර් ධනය වෙමින් පවතින රටවල ආර් ථිකයට එමගින් විශාල දායකත්වයක් ලැබිම..................ආදී

(කරුණු 3ට ලකුණු 3යි)

Iii. කුඩා ගොවි බිම්වල වී වගා කිරීම/ ඇතැම් රටවල ව්‍යාපාරික මට්ටමින් විශාල ගොවිබිම්වල වගා කිරීම/ඉන්දියාව , ජපානය, අ.එ.ජ, චීනය, පාකිස්ථානය, තායිලන්තය, වියට්නාමය වැනි රටවල වාණිජ පදනමකින් වි වගා කිරීම / ආසියාතික රටවල බෝහෝ විට ශ්‍රම සූක්ෂම වගාවක් වන අතර ආසියාවෙන් බැහැර ව විශාල වශයෙන් යන්ත්‍ර සූත්‍ර භාවිතා වේ/ ජාන තාක්ෂණය උපයෝගී කරගෙන විවිධ රෝගවලට ඔරොත්තු දෙන හා කෙටිකාලීන අස්වැන්න ලබා දෙන බීජ වර් ග භාවිතය / සහල් ආශ්‍රිත විවධ නිෂ්පාදන සැකසීම හා ඇසිරීම සඳහා නව ශිල්ප ක්‍රම භාවිතය.

(මින් කරුණු 3ක් දක්වා 2ක් විස්තර කළ යුතු ය. ල-5යි)

05) I. වියලි කලාපය

අතරමැදි කලාපය ( ල- 2 යි)

Ii. වැසි ජලය හා ජල සම්පාදනය මගින් වි වගාව සිදු කරන අතර වාරි ජලය මගින් ගොඩ වී වගාව ද සිදු කෙරේ/ යල හා මහ කන්නයේ ද ඇතැම් ප්‍රදේශවල මැද කන්නේ ද වි වගා කිරීම/ බිම් ඒකකයකින් ලබා ගන්නා අස්වනු ප්‍රමාණය වැඩි බැවින් සහල් අතිරික්තයක් නිපදවීම/ යන්ත්‍ර සූත්‍ර බහුලව යොදා ගැනීම.

( මින් කරුණු 3ක් ලකුණු 3යි)

Iii. සාගරයෙන් වට වූ දූපතක් වීම/ දිවයින වටා දිගු වෙරල තීරයක් පැවතිම/ පුළුල් මහද්වීපික තටකය / බොකු කලපු හා වරායන් පිහිටා තිබිම/ ගංගා, ඇළදොළ, වැව් හා ජලාශ පැවතීම/ මෝසම් කාලවල දියවැල් ක්‍රියාකාරිත්වය නිසා මත්ස්‍ය ආහාර බහුල වීම වැනි සාධක .( කරුණු 3ක් දක්වා 2ක් විස්තර කරන්න ල- 5යි)

06) I. අමුද්‍රව්‍ය , බලශක්තිය, ප්‍රවාහනය, යටිතල පහසුකම්, ප්‍රාග්ධනය,ශ්‍රමය, වෙළඳපොළ,රාජ්‍ය ප්‍රතිපත්ති (මින් කරුණු 2ට ලකුණු 2ක්)

Ii. නැව් නිෂ්පාදන කර් මාන්තයට අවශ්‍ය ලාභදායි ශ්‍රමය හා පුහුණු ශ්‍රමය/නව තාක්ෂණය/තටාක පහසුකම් සඳහා ජලය නොමිදෙන ගැඹුරු මුහුදු ප්‍රදේශ තිබීම/පාරම්පරික නැව් නිෂ්පාදන රටවල් සමඟ තරඟකාරි ලෙස ආසියාතික නව කාර් මිකරණ රටවල් නැව් නිෂ්පාදනය කිරිම/ GPS වැනි දියුණු තාක්ෂණික ක්‍රම නාවික ක්ෂේත්‍රයට එක් වීම/ඉන්ධන බහාලුම් ප්‍රවාහනය ආදී නෞකා නිෂ්පාදනයට ඉහළ ඉල්ලුමක් පැවතීම.

( කරුණු 3ට ලකුණු 3යි)

III. ඛනිජ තෙල් මිල වෙනස් වීම./බල ශක්ති සම්පත් ක්ෂය වෙමින් පැවතීම/ බලශක්ති සංචිත පවත්නා රටවල් දේශපාලන අරගලවලට මුහුණ දීම/ න්‍යෂ්ටික බලහක්තිය නිසා ඇතිවන පාරිසරික ගැටළු/බලශක්ති මූලාශ්‍රයක් ලෙස න්‍යෂ්ටික බලය වැදගත් වුව ද වෙනත් කාර් යන් සඳහා අයුතු ලෙස යොදා ගැනිම නිසා ඇතිවන ගැටළු. ( මින් ගැටළු 3ක් දක්වා 2ක් විස්තර කරන්න. ලකුණු 5යි)

07) I. කහටගහ/කොලොන්ගහ/බෝගල/රන්ගල/සියඹලාපිටිය/බෝතලේ/ රාගෙදර

( මින් 2ක්- ලකුණු 2යි)

II. පැන්සල් කූරු/ පොලිෂ්/තීන්ත වර් ග/ ලිහිසි ද්‍රව්‍ය/වියළි කෝෂ අමුද්‍රව්‍ය/අච්චු ( කෝව) නිෂ්පාදනය

(මින් 3ට ලකුණු 3යි)

III. මිනිරන් කැනීම සඳහා අධික වියදමක් දැරීමට සිදු වීම/සේවක ගැටළු (වැටුප්/ සෞඛ්‍යමය/තාක්ෂණය/අවධානය) / කැනිම්වල දී පරිසරයට හානි සිදු විම/ වර් තමානය වන විට ශ්‍රී ලංකාවේ මිනි රන් කැනීම් පතල් 2ට පමණක් සීමා විම/නිෂ්පාදන ප්‍රමාණය ක්‍රමයෙන් පහළ යැම/ දේශීය කාර් මික අමුද්‍රව්‍යක් ලෙස භාවිතයට ගැනීම ඉතා අවම මට්ටමක පැවතීම.

මින් කරුණු 3ක් දක්වා 2ක් විස්තර කරන්න. ලකුණු 5යි)

08) I. අනුරාධපුර/පොලොන්නරුව/සිගිරිය/ මහනුවර ( මින් 2ක් - ලකුණු 2යි)

II. කොළඹ නගරය / මහ කොළඹ කලාපය/ දකුණු වෙරලබඩ ප්‍රදේශය / මධ්‍යම කඳුකරය/ නැගෙනහිර වෙරළබඩ ප්‍රදේශය / උතුරු ප්‍රදේශය ( කරුණු 3ට ලකුණු 3යි)

III. සංචාරක කර් මාන්තයේ වේගවත් දියුනුවක් ඇති විම/සංචාරක පහසුකම් කඩිනමින් වැඩි දියුණු කරීම/ සංචාරක කර් මාන්තය ආශ්‍රිතව සෘජු හා වක්‍ර රැකියා අවස්ථා වැඩි වීම/ මෙම කර් මාන්තය සඳහා රාජ්‍ය හා පෞද්ගලික ආයෝජකයන්ගෙ අනුග්‍රහය ලැබීම./ විශේෂ පුහුණු ශ්‍රමිකයින් බිහි කිරීමට ආයතන යොමු වීම/

( මින් 3ක් දක්වා 2ක් විස්තර කරන්න. ලකුණු 5යි)

# LOL.lk
## BookStore

# විභාග ඉලක්ක
# පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න






| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර | A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් | School Book | ගුරු අත්පොත්

pesuru Prakashana Private Ltd. | Akura Pilot | සමනල දැනුම | T | සතර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර, කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

**www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න**